" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLSI · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024.08.01 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ අංක : 04/2023 (i)

ආණ්ඩුකාර ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම් (බ.ප),
ලේකම් (පළාත් පාලන / අධ්‍යාපන / කෘෂිකර්ම / ප්‍රවාහන / සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / පිරිස් හා පුහුණු / මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප),
ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය (බ.ප),
අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප),
ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්,

**ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.**

උක්ත ශීර්ෂයෙන් යුතුව රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2024.06.07 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (IV) බස්නාහිර පළාතට අදාල කර ගෙන ඇති බැවින් මගේ අංක CSWP/ADM/18-38/FI/05-2023 හා 2023.07.26 දිනැතිව නිකුත් කරන ලද පාලන චක්‍රලේඛ අංක 04/2023 මගින් හඳුන්වා දුන් දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ අයදුම්පත්‍රය හා එම නිලධාරීන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම්පත්‍ර මෙයින් අවලංගු කරන අතර ඒ වෙනුවට මේ සමඟ යොමු කරනු ලබන නව අයදුම්පත්‍රය හා නව ගිවිසුම්පත්‍ර භාවිතා කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

i). රා.ප.ච. 14/2022 සහ එහි සංශෝධනයන් අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් දේශීය නිවාඩු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රය - ඇමුණුම 01

ii). විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධාරීන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම - ඇමුණුම 02

iii). දේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධාරීන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම - ඇමුණුම 03

02. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ ,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092600
ෆැක්ස් අංකය : 011-2092601
විද්‍යුත් ලිපිනය : chiefsecretary@wpc.gov.lk

(ඇමුණුම 01)



**රා.ප.ච. 14/2022 සහ එහි සංශෝධනයන් අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් දේශීය නිවාඩු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) - ..............................................................................................

02. සම්පූර්ණ නම - ..............................................................................................

..............................................................................................

03. තනතුර හා ශ්‍රේණිය - ..............................................................................................

04. උපත් දිනය - ................................................ වයස - ................................................

05. ජා.හැ.අංකය- ......................................................

06. පෞද්ගලික ලිපිනය - ..............................................................................................

..............................................................................................

07. පෞද්ගලික දුරකථන අංකය - ජංගම.................................... ස්ථාවර.......................................

08. කාර්යාලයේ ලිපිනය - ..............................................................................................

09. කාර්යාලයේ දුරකථන අංකය -...................................................

10. නිවාඩු ඉල්ලුම් කිරීමේ හේතුව (රාප.ච.14/2022(II) 4.1 වගන්තිය අනුව) -..............................................

..............................................................................................

11. නිවාඩු ඉල්ලුම් කරන කාලසීමාව - ..............................................................................................

12. දේශීය නිවාඩු ලබා සිටින කාලය තුල රාජකාරි ආවරණය/ වැඩ බැලීම සඳහා යොදා ඇති,

i. නිලධාරියාගේ නම -..............................................................................................

ii. තනතුර - ..............................................................................................

............................................ ..................................

දිනය අයදුම්කරුගේ අත්සන

---

ආයතනයේ යොමු අංකය-...............................

දෙපාර්තමේන්තු ප්‍රධානී,

.......................................

13. මෙම අයදුම්පත්‍රයේ ඉහත සඳහන් තොරතුරු නිවැරදිය.

14. අයදුම්කරුගේ මුල් පත්වීමේ දිනය- .........................................................

15. අයදුම්කරුගේ සේවය ස්ථිර කර ඇතිද යන වග - ඇත/නැත

ස්ථිර කර ඇති නම් ස්ථිර වූ දිනය-.......................................................

16. අයදුම්කරු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙක්ද - ඔව්/නැත

............................... ..........................................

දිනය ස.ලේකම්./පරිපාලන නිලධාරි

---

ආයතනයේ යොමු අංකය-...............................

අමාත්‍යාංශ ලේකම්/ස.ප්‍ර.ලේ.(පාලන),

...........................................................

17. i. අයදුම්කරු අත්තිකාරම 'බී' ගිණුමෙන් ණය ලබා ගෙන ඇත/නැත.ලබාගෙනඇතිනම්,

එම ණය..................... දිනැති ලදුපත් අංක .............. මගින් සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇත.

ii. පෞද්ගලික බැංකු ණය/ ආපදා ණය වැටුපෙන් අයකිරීම සඳහා ගණකාධිකාරී/ මූල්‍ය නිලධාරියකු විසින්, බැංකුව වෙත එකගතා ආකෘති පත්‍රයක් අත්සන් කර ඇත/නැත.

iii. වෙනත් ණය (රාජ්‍ය නිලධාරින්ගේ සංගම්/ලෝහෝර් ආර්යා ණය අරමුදල වැනි) සඳහා වැටුපෙන් අය කිරීමට එකඟතා ආකෘති පත්‍රයක් අත්සන් කර ඇත/නැත.

.............................. ..........................................................

දිනය ගණකාධිකාරී/මූල්‍ය අංශ ප්‍රධානී

---

ආයතනයේ යොමු අංකය-...................................

අමාත්‍යාංශ ලේකම්/ස.ප්‍ර.ලේ.(පාලන)

....................................................

18. රාජකාරි ආවරණය කරනු ලබන නිලධාරියා ඒ සඳහා කැමැත්ත ප්‍රකාශිත ලිපියක් අමුණා ඇත/නැත

19. මෙම අයදුම්කරුට විරුද්ධව විනයානුකුල ක්‍රියාමාර්ගයක් දැනට පවතින/නොපවතින බවත්, එසේ විනයානුකුල ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉදිරියේදී අදහස් කර ඇති/නොමැති බවත් සහතික කරමි.

20. අයදුම්කරු කිසියම් විශේෂිත වූ ගිවිසුම් සඳහා බැඳීමක් ඇත/නැත

"ඇත" නම් ඒ පිළිබඳ විස්තර

..........................................................................................................................................................

21. ඉහත 17.ii හි "ඇත" යනුවෙන් සඳහන් වන්නේ නම්, ඉතිරි ණය ශේෂය අය කිරීමට අදාල නිලධාරියා විසින් බැංකුවට යෝජිත ක්‍රමවේදයට බැංකුව විසින් එකඟතාවය ලබා දුන් ලිපියක් ලබා ගෙන එය ඉදිරිපත් කර ඇත/නැත

22. මෙම නිවාඩු ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

23. නිර්දේශ නොකරන්නේ නම් ඒ සඳහා හේතු

..........................................................................................................................................................

................................ ....................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියා

---

ආයතනයේ යොමු අංකය-...................................

ප්‍රධාන ලේකම්/අමාත්‍යාංශ ලේකම්

...............................................

24. උක්ත නම් සඳහන් නිලධාරියා/නිලධාරිනිය ගේ ..................................දින සිට.................................. දින දක්වා වන වැටුප් රහිත දේශීය නිවාඩුව .................................. දිනපැවති ඊට අදාලව පත් කර ඇති කමිටුව විසින් නිර්දේශ කරඇත.

.............................. ....................................

දිනය කමිටු සභාපති

---

25. උක්ත නම් සඳහන් නිලධාරියා/නිලධාරිනිය ගේ .............................. දින සිට ..............................දින දක්වා වන කාලපරිච්ඡේදය සඳහා වන දේශීය නිවාඩු ඉල්ලීම අනුමත කරමි/නොකරමි.

................................ ..........................................

දිනය අමාත්‍යාංශ ලේකම්/ප්‍රධාන ලේකම්

(ඇමුණුම 02)

# ගිවිසුමයි.

මෙහි පහත ඇතැම් තැනක "පළමු පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන අමාත්‍යාංශ ලේකම් /නියෝජ්‍ය ප්‍රධාන ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන ......................................................................යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අයද සමග) එක් පක්ෂයකට ද,මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ...................................................................................... (බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පළාත් අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...................................................................................................තනතුරක් දරන ............................................................................................................................ යන ලිපිනය ඇති ............................................................................................................................යන අය අනෙක් පාර්ශවය වශයෙන්ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛය, 2022.09.06 දිනැති අංක 14/2022(I) චක්‍රලේඛය, 2022.09.15 දිනැති අංක 14/2022(II) චක්‍රලේඛය, 2023.07.13 දිනැති අංක 14/2022 (III) චක්‍රලේඛය, 2024/06/07 දිනැති අංක 14/2022 (IV) චක්‍රලේඛය යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන විධි විධාන ප්‍රකාරව විදේශ වැටුප් රහිත නිවාඩු දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම්කිරීමට අපේක්ෂා කර ඇති හෙයින් ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමකදී ,ඊට අදාලව ඉහත කී චක්‍රලේඛන විධි විධානයන්ට යටත්ව වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින් ද විදේශීය නිවාඩු කාල සීමාව තුල ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් යටතේ ගිවිසුම්ගත වන අවස්ථාවේ බලාත්මක විධි විධානයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ එකී පාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම් වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුලත් වේ.

**ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;**

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛය, 2022.09.06 දිනැති අංක 14/2022(I) චක්‍රලේඛය, 2022.09.15 දිනැති අංක 14/2022(II) චක්‍රලේඛය, 2023.07.13 දිනැති අංක 14/2022(III) චක්‍රලේඛය, 2024/06/07 දිනැති අංක 14/2022(IV) චක්‍රලේඛය යන චක්‍රලේඛ මෙම ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් ගිවිසුම්ගත අවස්ථාවේ බලාත්මක එකී චක්‍රලේඛන කොන්දේසි හා

නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. මෙම ගිවිසුමේ පළමුවන කොන්දේසිය යටතේ පිළිගන්නට යෙදුනු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් යටතේ සඳහන් විධිවිධාන, ඊට අදාළව රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මඟින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය දෙවන පාර්ශවය වෙත රා.ප.ච.අංක: 14/2022 චක්‍රලේඛය යටතේ විදේශ නිවාඩු අනුමත කිරීමේ දී, එම චක්‍රලේඛයෙහි 02 සහ 03 ඡේද අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු බවද දෙපාර්ශවය පිළිගනියි.

4. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ විදේශ නිවාඩු කාල සීමාව තුළ මෙම ගිවිසුම යටතේ පිළිගන්නට යෙදුනු චක්‍රලේඛන යටතේ ගිවිසුම්ගත වන අවස්ථාවේ බලාත්මකව පැවති කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළව එම චක්‍රලේඛ යටතේ හිමි වූ කවර හෝ හිමිකමක් සඳහා අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

5. දෙවන පාර්ශවයට විදේශ නිවාඩු කාල සීමාව තුළ රටින් බැහැරව සිටින කාල සීමාවේ දී මෙම ගිවිසුම යටතේ පිළිගන්නට යෙදුනු චක්‍රලේඛන අනුව නිවාඩු අනුමත කරනු ලබන දිනට පෙර දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත විදේශ මුදලින් ප්‍රේෂණය කිරීමේ දී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වන අතර, ඒ හා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කලින් කල ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසි පිළිගනිමින් පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ............... ක් වූ ............................ මස ............දින .......................... දී අත්සන් තබන ලදී.

පළමු පාර්ශවය වෙනුවෙන්

අත්සන : ..........................................................................................................................

නම : ..........................................................................................................................

ලිපිනය : ..........................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................

නිල මුද්‍රාව

දෙවන පාර්ශවය වෙනුවෙන්

අත්සන : ..........................................................................................................................

නම : ..........................................................................................................................

ලිපිනය : ..........................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................

**සාක්ෂි :**

1. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :

(ඇමුණුම 03)

# ගිවිසුමයි.

මෙහි පහත ඇතැම් තැනක "පළමු පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන අමාත්‍යාංශ ලේකම් /නියෝජ්‍ය ප්‍රධාන ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන .......................................................................යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අයද සමග) එක් පක්ෂයකට ද,මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන .......................................................................... (බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පළාත් අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..........................................................................තනතුරක් දරන ................................................................................................ යන ලිපිනය ඇති .......................................................................................................යන අය අනෙක් පාර්ශවය වශයෙන්ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛය, 2022.09.06 දිනැති අංක 14/2022(I) චක්‍රලේඛය, 2022.09.15 දිනැති අංක 14/2022(II) චක්‍රලේඛය, 2023.07.13 දිනැති අංක 14/2022 (III) චක්‍රලේඛය, 2024/06/07 දිනැති අංක 14/2022 (IV) චක්‍රලේඛය යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන විධි විධාන ප්‍රකාරව දේශීය වැටුප් රහිත නිවාඩු දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම්කිරීමට අපේක්ෂා කර ඇති හෙයින් ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමකදී ,ඊට අදාලව ඉහත කී චක්‍රලේඛන විධි විධානයන්ට යටත්ව වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින් ද දේශීය නිවාඩු කාල සීමාව තුල ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් යටතේ ගිවිසුම්ගත වන අවස්ථාවේ බලාත්මක විධි විධානයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ එකී පාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම් වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුලත් වේ.

**ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;**

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛය, 2022.09.06 දිනැති අංක 14/2022(I) චක්‍රලේඛය, 2022.09.15 දිනැති අංක 14/2022(II) චක්‍රලේඛය, 2023.07.13 දිනැති අංක 14/2022(III) චක්‍රලේඛය, 2024/06/07 දිනැති අංක 14/2022(IV) චක්‍රලේඛය යන චක්‍රලේඛ මෙම ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් ගිවිසුම්ගත අවස්ථාවේ බලාත්මක එකී චක්‍රලේඛන කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. මෙම ගිවිසුමේ පළමුවන කොන්දේසිය යටතේ පිළිගන්නට යෙදුනු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් යටතේ සඳහන් විධිවිධාන, ඊට අදාළව රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මගින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) යටතේ දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමේ දී, ඉහත කී දෙවන පාර්ශවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) හි 3.3 ඡේදයට අනුව, අදාල චක්‍රලේඛය යටතේ වැටුප් රහිත නිවාඩු සඳහා හිමිකම් ඇති සේවා ගනයන් හා තනතුරු දරන අයෙකු වන්නේ ද යන්න පිළිබඳව හඳුනාගැනීමට පත් කරන කමිටුව විසින් තෝරා ගත් පාර්ශවයක් බව දෙපාර්ශවය පිළි ගනියි.

4. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ දේශීය නිවාඩු කාල සීමාව තුළ මෙම ගිවිසුම යටතේ පිළිගන්නට යෙදුනු චක්‍රලේඛන යටතේ ගිවිසුම්ගත වන අවස්ථාවේ බලාත්මකව පැවති කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළව එම චක්‍රලේඛ යටතේ හිමි වූ කවර හෝ හිමිකමක් සඳහා අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

5. දෙවන පාර්ශවය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් බැහැරව සිටින කාල සීමාවේ දී මෙම ගිවිසුම යටතේ පිළිගන්නට යෙදුනු චක්‍රලේඛන අනුව නිවාඩු අනුමත කරනු ලබන දිනට පෙර දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලංකාවේ වලංගු මුදලින් ගෙවීමේදී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වන අතර, ඒ හා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කලින් කල ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

6. දෙවන පාර්ශවයට දේශීය නිවාඩු කාල සීමාව තුළ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් බැහැරව සිටින කාල සීමාවේ දී මෙම ගිවිසුම යටතේ පිළිගන්නට යෙදුනු චක්‍රලේඛයන්ට අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසි පිළිගනිමින් පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ............... ක් වූ ............................. මස ............දින .......................... දී අත්සන් තබන ලදී.

පළමු පාර්ශවය වෙනුවෙන්

අත්සන : ........................................................................................................

නම : ........................................................................................................

ලිපිනය : ........................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................................

නිල මුද්‍රව

දෙවන පාර්ශවය වෙනුවෙන්

අත්සන : ........................................................................................................

නම : ........................................................................................................

ලිපිනය : ........................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................................

**සාක්ෂි :**

1. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :